**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි තෙවන වසර පරීක්ෂණය**

**දෙවන සෙමෙස්තරය - 2018**

**CMS 3247 - කලා විචාරය : න්‍යාය හා භාවිතය**

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න** **කාලය පැය දෙකයි**

---

01. අලංකාරවාදී විචාර සිද්ධාන්තය හඳුන්වා දී 'වක්‍රොක්ති' හා 'අතිශයොක්ති' යන සංකල්ප නිදර්ශන සහිත ව පැහැදිලි කරන්න.

**(ලකුණු 20)**

02. භාෂාවේ අර්ථ ජනනය පිළිබඳ ධ්වනිවාදීන් ඉදිරිපත් කළ විග්‍රහය සංක්ෂිප්ත ව දක්වා කාව්‍යකරණයේදී ව්‍යංග්‍යාර්ථ වැදගත් වන ආකාරය පෙන්වා දෙන්න.

**(ලකුණු 20)**

03. 'විභාවානුභාවව්‍යභිචාරීසංයොගාත් රසනිෂ්පත්තිඃ' භරතමුනිගේ මෙම රසසූත්‍රය විවරණය කොට ඒ පිළිබඳ ව ප්‍රකාශිත අර්ථකථන සැකෙවින් ඉදිරිපත් කරන්න.

**(ලකුණු 20)**

04. බටහිර කලා විචාරයේ සම්භාව්‍ය යුගය නියෝජනය කරන ප්ලේටෝ කලාව සම්බන්ධ ව දක්වා ඇති අදහස් සමාලෝචනය කරන්න.

**(ලකුණු 20)**

*(අනෙක් පිටුවට)*

05. අධියථාර්ථවාදී කලා කෘති යථාර්ථවාදී කලාවේ මූලධර්මවලට අභියෝග කරන ආකාරය නිදර්ශන සහිත ව පැහැදිලි කරන්න.

(ලකුණු 20)

06. 'බැද්දේගම' නවකතාව පිළිබඳ පශ්චාත් යටත්විජිතවාදී විශ්ලේෂණයක් සපයන්න.

(ලකුණු 20)

---

07. පහත සඳහන් මාතෘකා අතරින් හතරක් (04) තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(අ) ප්‍රතිභා

(ආ) සාධාරණීකරණය

(ඇ) චමත්කාරය

(ඉ) අභිනවගුප්ත

(ඊ) ඩඩාවාදය

(ඊ) අනෙකා සහ අන්‍යකරණය

(උ) ස්වාත්මීකරණය

**(එක් කෙටි සටහනකට ලකුණු 05 බැගිනි)**